# මානවශාස්ත්‍ර පීඨය

කුලතිලක කුමාරසිංහ

කැලණිය විශ්වවිද්‍යාලයේ ආදි සංඝාරාමය වූ විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයේ සමාරම්භය දක්වා විහිදෙන ඉතිහාසයක් මානවශාස්ත්‍ර පීඨය සතුව පවතී. වැඩිදුරටත් කරුණු පරීක්ෂා කළ හොත් විද්‍යාලංකාර පිරිවෙණෙන් ආරම්භය වූ කලී මානවශාස්ත්‍ර නගා සිටුවීමේ ව්‍යායාමයේ ප්‍රතිඵලයකි. 19වන සියවස තුළ ප්‍රාචීන භාෂා ශාස්ත්‍ර හා බුදුදහම මුහුණ දුන් අර්බුදකාරී තත්ත්වයට සාර්ථක ලෙස පිළියම් යෙදීම සඳහා වර්ෂ 1875 නොවැම්බර් මස 01 දින පෑලියගොඩ විද්‍යාලංකාර පිරිවෙන පිහිටුවන ලදී. දිගු කාලීන යටත් විජිත පාලනය හේතු කොට ගෙන මේ අවධිය වන විට සිංහල භාෂාව අදහස් හා හැඟීම් ප්‍රකාශනය අතින් දුර්වල තත්ත්වයක පැවතුණි. භාෂාව මුහුණ දී සිටි අර්බුදකාරී තත්ත්වයෙන් මුදාගන්නා අතර ම බුදුදහමට එල්ල වූ අන්‍යාගමික තර්ජනයට සාර්ථක ව මුහුණ දීම සඳහා විද්‍යාලංකාර පිරිවෙන ගොඩනැගුණේ යැයි පැවසීම අතිශයෝක්තියක් නොවේ. ඒ අනුව විද්‍යාලංකාර උරුමය වූ භාෂා ශාස්ත්‍ර නගා සිටුවීම හා බුදුදහම සංරක්ෂණය තර ප්‍රචලිත කිරීම යන පරමාර්ථ වැඩිදුරටත් තහවුරු කරගෙන වර්තමාන අවධිය පෙරට ගෙන ඒමේ අභිලාෂය පෙරදැරි කරගෙන මානවශාස්ත්‍ර පීඨය ගොඩනැගුණේ යැයි පැවසීමට පුළුවන.

මේ වන විට කැලණිය විශ්වවිද්‍යාලයේ පීඨ හයක් දැකිය හැකිය. ඒ මානවශාස්ත්‍ර, සමාජීය විද්‍යා, විද්‍යා, වෛද්‍ය, වාණිජ හා කළමනාකරණ හා පශ්චාද් උපාධි පීඨ යනුවෙනි. මේ පීඨ අතුරෙන් විශ්වවිද්‍යාලයේ දැක්ම හා බැඳුණු මූලික කාර්යභාරය ඉටු කරනු ලබනුයේ මානවශාස්ත්‍ර පීඨය විසිනි. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද අංක 106 දරණ චක්‍ර ලේඛනය මගින් 1981/82 අධ්‍යයන වර්ෂයේ සිට මෙතෙක් ක්‍රියාත්මක වූ කලා පීඨය දෙකට බෙදා මානවශාස්ත්‍ර පීඨය හා සමාජීය විද්‍යා පීඨය යනුවෙන් නම් කරනු ලැබිය. බෞද්ධ අධ්‍යයනය, පාලි, සිංහල, සංස්කෘත, නූතන භාෂා, ඉංග්‍රීසි, හින්දි, ලලිත කලා, බටහිර සම්භාව්‍ය සංස්කෘතිය හා ක්‍රිස්තියානි සංස්කෘතිය හා වාග්විද්‍යාව යන අධ්‍යයන අංශ මානවශාස්ත්‍ර පීඨය යටතට පත් කරන ලදී.

මෙකී විෂය ක්ෂේත්‍රවලින් වැඩි කොටසක් විද්‍යාලංකාර පිරිවෙන් අවධියේ දී ද 1959 ජනවාරි 01 දා විශ්වවිද්‍යාල තත්ත්වය ලැබීමෙන් පසුව ද විද්‍යාර්ථීන් විසින් අධ්‍යයනය කරනු ලැබිය.